ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையகக் கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayewardenepura Kotte, Sri Lanka. *Website : www.defence.lk*

මගේ අංකය / எனது இல. / My No. } MOD/CSD/REPORT/1/CIRCULAR (2026)
ඔබේ අංකය / உமது இல. / Your No. }

තැ. පෙ. / த. பெ.இ / P. O. Box } 572 | දුරකථන / தொலைபேசி / Telephone } 011 2430860-9, 011 2430870-8 | ලේකම් / செயலாளர் / Secretary } දුර./தொலை./ Tel.: 011 2381154, ෆැක්ස්/தொ./Fax: 011 2541529, වි. තැපෑල/மி. அ./Email: secdefence@defence.lk | දිනය / திகதி / Date } 2026.08. 29

චක්‍රලේඛ අංක : 01/2026

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන් වෙත,

<u>2027 වර්ෂය සඳහා තුවක්කු ආඥාපනත ක්‍රියාත්මක කිරීම හා නියාමනය</u>

**2027** වර්ෂය සඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම **2026** සැප්තැම්බර් මස **01** දිනෙන් ආරම්භ වී **2026** දෙසැම්බර් මස **31** දිනෙන් අවසන් විය යුතුය. මේ සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම **2026.08.25** වන දින භාෂාත්‍රයෙන්ම පළ කිරීමට මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කර ඇත.

2. නව ගිනිඅවි බලපත්‍ර ලබාදීමේ නිර්ණායක

2.1 <u>කෘෂිකාර්මික කටයුතු (වගා ආරක්ෂක) සඳහා</u>

i. නව ගිනිඅවි සඳහා ඉල්ලුම්පත්‍ර සම්පූර්ණ කර තමන් පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය.

ii. වයස අවුරුදු 65ට නොවැඩි විය යුතු අතර, අවම වයස අවුරුදු 21 ට වැඩි විය යුතුය.

iii. කෘෂිකාර්මික ඉඩම් ඔප්පුවල සහතික කරන ලද ඡායා පිටපත් සහ ඊට අදාළ පත්තිරු (ඉල්ලුම්කරු නමින් හෝ කලත්‍රයාගේ නමින් අවම වශයෙන් අක්කර 05 හෝ ආරක්ෂක ලේකම් විසින් තීරණය කරන ඉඩම් ප්‍රමාණයක් පවතින බවට ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර තිබිය යුතු අතර, භාතිත්වය තහවුරු කිරීම සඳහා නීතිමය ලියවිලි ඉදිරිපත් කළ යුතුය).

iv. ගිනිඅවි ඉල්ලුම්කරුගේ දෙමාපියන්ගේ / කලත්‍රයාගේ / සහෝදරයින්ගේ ඉඩම් වල වගාකරන අවස්ථාවලදී එම ඉඩම් හිමිකරුවන්ගෙන් වගා කිරීම සම්බන්ධව හා ගිනිඅවිය ලබාදීම පිළිබඳ විරුද්ධත්වයක් නොමැති බවට දිවුරුම් ප්‍රකාශ ලබාගෙන එම ඉල්ලීම සලකා බැලිය හැකිය. තව ද ඉල්ලුම්කරු නමින් අවම ඉඩම් ප්‍රමාණයක් නොමැති නම් ඔහු වගා කටයුතු කරන ඉඩම් සඳහා බදු ඔප්පු/ඇටෝර්නි බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය. බදු ඔප්පු ඉදිරිපත් කිරීමේදී එම ඉඩම් එකිනෙකට යාබදව පිහිටා තිබිය යුතුය. ඉහත ඔප්පු අවම වසර දෙකක කාල සීමාවක් වලංගු විය යුතුය.

v. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයේ (ප්‍රා/ලේ ඇම. 201 ආකෘතිය) මුල් පිටපත හෝ ආසන්න වසර 03ක ආදායම් බදු ගෙවීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව (වාර්ෂික ආදායම රු. 400,000/-ට වැඩි විය යුතුය).

vi. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.

අතිරේක ලේකම් (පරිපාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration) — දුර./தொலை./ Tel.: 011 2326000, ෆැක්ස්/தொ./Fax: 011 2446300
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) / மேலதிக செயலாளர் (சிவில் பாதுகாப்பு அபிவிருத்தி) / Additional Secretary (Civil Defence and Development) — දුර./தொலை./ Tel.: 011 2335792, ෆැක්ස්/தொ./Fax: 011 2335797
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) / பணிப்பாளர் நாயகம் (திட்டமிடல்) / Director General (Planning) — දුර./தொலை./ Tel.: 011 2333963, ෆැක්ස්/தொ./Fax: 011 2336559
අතිරේක ලේකම් (ආරක්ෂක) / மேலதிக செயலாளர் (பாதுகாப்பு) / Additional Secretary (Defence) — දුර./தொலை./ Tel.: 011 2389186, ෆැක්ස්/தொ./Fax: 011 2441481
අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) / மேலதிக செயலாளர் (பாராளுமன்றம் மற்றும் கொள்கை) / Additional Secretary (Parliament Affairs and Policy) — දුර./தொலை./ Tel.: 011 2389023, ෆැක්ස්/தொ./Fax: 011 2389022
අතිරේක ලේකම් (තාක්ෂණ) / மேலதிக செயலாளர் (தொழில்நுட்பம்) / Additional Secretary (Technical) — දුර./தொலை./ Tel.: 011 2333930, ෆැක්ස්/தொ./Fax: 011 2421479
ප්‍රධාන මූල්‍ය නිලධාරී-I / தலைமை நிதி அதிகாரி - I / Chief Financial Officer - I — දුර./தொலை./ Tel.: 011 2439381, ෆැක්ස්/தொ./Fax: 011 2390720
ප්‍රධාන මූල්‍ය නිලධාරී-II / தலைமை நிதி அதிகாரி - II / Chief Financial Officer - II — දුර./தொலை./ Tel.: 011 2421484, ෆැක්ස්/தொ./Fax: 011 2421484

vii. ඔප්පුවලට අයත් ඉඩම්වල ඇති වගාවන් මොනවාද, ඒවා කොපමණ ප්‍රමාණයකින් යුක්තද, එම වගාවන්ට සිදුවන හානි පිළිබඳව කරුණු ඇතුළත් දිස්ත්‍රික් ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙතින් ලබා ගත් වගා හානි සහතිකයක් (ඉඩම පිහිටි බල ප්‍රදේශයේ).

viii. වගා ඉඩම් පිහිටීම පදිංචි දිස්ත්‍රික්කයෙන් පරිබාහිර දිස්ත්‍රික්කයක නම් මුරකරු බලපත්‍රයක් යටතේ භාවිත කිරීමට එකඟතාවය දක්වන ලිපිය

ix. වගා ඉඩම් පිහිටීම පිළිබඳ ඉඩම පිහිටි වසමේ ග්‍රාම නිලධාරී සහතිකය

x. දී ඇති තොරතුරු නිවැරදි බවටත් ගිනිඅවියක් භාවිත කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව ඇති බවටත්, ගිනිඅවිය අවභාවිත නොකරන බවට හා බලපත්‍ර කොන්දේසි කඩ නොකරන බව සඳහන් දිවුරුම් ප්‍රකාශයක්.

xi. ගිනිඅවිය නිශ්චිත පුද්ගලයෙකු වෙත නිකුත් කල යුතු අතර තනතුරු නාමයට හෝ ආයතනය නාමින් පමණක් නිකුත් කරනු නොලැබේ.

xii. ඉල්ලුම්කරුගේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය නොවන අවස්ථාවකදී, ගිනිඅවියක් ලබා ගැනීම සම්බන්ධයෙන් තම රැකියා ස්ථානයේ ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් විරෝධතාවයක් නොමැති බවට ලිපිය සහ මුරකරු බලපත්‍රයක් යටතේ ගිනිඅවිය ලබාගැනීමට ඉල්ලුම්කරුගේ කැමැත්ත දක්වන ලිපිය ඉදිරිපත් කල යුතුය.

## 2.2 කෘෂිකාර්මික කටයුතු (සත්ත්ව පාලනය) සඳහා

i. සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශිත අයදුම්පත්‍රය.

ii. වයස අවුරුදු 65ට නොවැඩි විය යුතු අතර, අවම වයස අවුරුදු 21ට වැඩි විය යුතුය.

iii. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ආදායම් සහතිකයේ (ප්‍රා/ලේ ඇම . 201 ආකෘතිය) මුල් පිටපත හෝ ආසන්න වසර 03ක ආදායම් බදු ගෙවීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව (වාර්ෂික ආදායම රු. 400,000/- ට වැඩි විය යුතුය).

iv. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත හා ග්‍රාම නිලධාරි සහතිකය(පදිංචි වසමේ)

v. සත්ත්ව පාලනය සඳහා ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීමේ දී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ගොවිපළ ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (සහතික කළ).

vi. ගොවිපළ සතු සතුන් වර්ග, ප්‍රමාණය හා එම සතුන්ට **සත්‍යය වශයෙන්ම හානි සිදුවනවා ද යන්න** පිළිබඳ ප්‍රදේශයේ සත්ත්ව සංවර්ධන උපදේශක මගින් හෝ අදාළ ප්‍රදේශයේ රජයේ පශු වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් සහතිකයක්.

vii. ගොවිපළ පිහිටි ඉඩම් අයිතිය තහවුරු කරන ලේඛන.

viii. මෙහිදී අවම වශයෙන් කුකුල් ගොවිපලක නම් අවම ලෙස කුකුළන් 5000ක් සිටිය යුතු අතර, සහ අනෙකුත් සත්ත්ව ගොවිපලවල් සඳහා ගොවිපලේ සිටිය යුතු අවම සතුන් ප්‍රමාණය 400ක් විය යුතුය.

ix. දී ඇති තොරතුරු නිවැරදි බවටත් ගිනිඅවියක් භාවිත කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව ඇති බවටත්, ගිනිඅවිය අවභාවිත නොකරන බවට හා බලපත්‍ර කොන්දේසි කඩ නොකරන බව සඳහන් දිවුරුම් ප්‍රකාශයක්.

x. ගිනිඅවිය නිශ්චිත පුද්ගලයෙකු වෙත නිකුත් කල යුතු අතර තනතුරු නාමයට හෝ ආයතනය නමින් පමණක් නිකුත් කරනු නොලැබේ.

xi. ඉල්ලුම්කරුගේ ප්‍රධාන රැකියාව කෘෂිකර්මාන්තය නොවන අවස්ථාවකදී, ගිනිඅවියක් ලබා ගැනීම සම්බන්ධයෙන් තම රැකියා ස්ථානයේ ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් විරෝධතාවයක් නොමැති බවට ලිපිය සහ මුද්‍රකරු බලපත්‍රයක් යටතේ ගිනිඅවිය ලබාගැනීමට ඉල්ලුම්කරුගේ කැමැත්ත දක්වන ලිපිය ඉදිරිපත් කල යුතුය

## 2.3 <u>කෘෂිකාර්මික නොවන (දේපළ ආරක්ෂාව) කටයුතු සඳහා</u>

i. සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශිත අයදුම්පත්‍රය.
ii. වයස අවුරුදු 65ට නොවැඩි විය යුතු අතර අවම වයස අවුරුදු 21ට වැඩි විය යුතුය.
iii. ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
iv. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඡායා පිටපත.
v. දේපළ හා වත්කම් පිළිබඳ වූ ලිපිලේඛන පිටපත් (ඔප්පු පිටපත්, වාහන ලියාපදිංචි කිරීමේ සහතික, සමාගම් හිමිකම් සහතික).
vi. සොරකම්, මංකොල්ලකෑම් පිළිබඳ හෝ මරණ තර්ජන පිළිබඳ කරන ලද පොලිස් පැමිණිලිවල පිටපත්.
vii. පසුගිය වසර තුනෙහි ආදායම් බදු ගෙවූ සංක්ෂිප්ත වාර්තාව (වාර්ෂිකව රු. 500,000/-ට වැඩි ආදායම් බදු ගෙවිය යුතුය).
viii. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවූ ගෙවීම් පත්‍රිකාවල පිටපත්.
ix. දෛනික මුදල් ප්‍රවාහන කටයුතු සහ බැංකු තැන්පතුවල සහතික කළ පිටපත්.
x. සංස්ථාවක්, මණ්ඩලයක් හෝ සමාගමක් නම් ගිනිඅවිය ලබාදීම පිළිබඳ අනෙකුත් අධ්‍යක්ෂකවරුන්ගේ එකඟතාවය.
xii. දී ඇති තොරතුරු නිවැරදි බවටත් ගිනිඅවියක් භාවිත කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව ඇති බවටත්, ගිනිඅවිය අවභාවිත නොකරන බවට හා බලපත්‍ර කොන්දේසි කඩ නොකරන බව සඳහන් දිවුරුම් ප්‍රකාශයක්.

***සටහන : දේපළ ආරක්ෂාවට හා ජීවිත ආරක්ෂාවට අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් පමණි. ඒ පිළිබඳව ඔබගෙන් විමසන අවස්ථාවලදී මෙම අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කරන්න.**

## 3. <u>පතරොම් වැය වාර්තාව</u>

වාර්ෂික ගිනිඅවි බලපත්‍ර ලබා ගැනීමේදී එම ගිනිඅවි සඳහා නිකුත් කරන ලද වාර්ෂික පතරොම් වැය වාර්තාව පිළිබඳව අධීක්ෂණය කර නව බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කල යුතුය.

4. <u>ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම</u>

**4.1** තුවක්කු ආඥා පනතේ 5 (1) වන වගන්තිය ප්‍රකාරව පහත i,ii,iii,iv,v දැක්වෙන කාණ්ඩවලට අයත් ගිනිඅවි හැර අනෙකුත් ගිනිඅවි සඳහා බලපත්‍ර අලුත් කිරීමේ බලය මෙයින් ඔබ වෙත පවරනු ලැබේ.

i. පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන වෙත නිකුත් කර ඇති සියලුම ගිනිඅවි (ඔබ වෙත බලය පවරා ඇති ගිනිඅවි හැර)
ii. සියලුම පිස්තෝල
iii. සියලුම රිවෝල්වර්
iv. ක්‍රීඩා කටයුතු සඳහා භාවිතා වන ගිනිඅවි
v. ජීවිත ආරක්ෂාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රජයේ ඉහළ නිලධාරීන්ට නිකුත් කර ඇති රිපීටර්

**4.2** ඉහත i, ii, iii, iv,v කාණ්ඩ යටතේ දක්වා ඇති ගිනිඅවි සඳහා බලපත්‍ර මෙම අමාත්‍යාංශය මගින් අලුත් කරනු ලැබේ.

**4.3** ඉහත 4.1 හි සඳහන් ගිනිඅවි හැරුණු විට අනෙකුත් සියලුම ගිනිඅවි අලුත් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව තහවුරු කර ගත යුතුය.

i. අදාළ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ නිර්දේශය ලැබී ඇති බවට සෑහීමකට පත්විය යුතුය.
ii. ගිනිඅවිය උප පොලිස් පරීක්ෂක නිලයට පහළ නොවන නිලයක් දරන ලද නිලධාරියෙකු විසින් පරීක්ෂා කරන ලද බවටත් ගිනිඅවියේ සඳහන් අනුක්‍රමික අංකය අවසන් වරට ලබාගත් බලපත්‍රයේ සඳහන් අංකය බවටත් සහතික කළ යුතු අතර, එම ප්‍රකාශය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විසින් සහතික කර තිබිය යුතුය.
iii. ගිනිඅවියේ සඳහන් අංකය හා වාර්ෂික බලපත්‍රයේ සඳහන් අංකය එකිනෙකට වෙනස් බවට වන ඉල්ලීම් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් වන බැවින් වාර්ෂික ගිනිඅවි බලපත්‍ර නිකුත් කරන විට ඉහත ii සඳහන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සහතිකය පිළිබඳව දැඩි අවධානයක් යොමු කර ගිනිඅවියේ අංකයේ නිරවද්‍යතාවය පිළිබඳ සෑහීමකට පත්විය යුතු අතර, අංකය වෙනස්වන අවස්ථාවකදී ගිනිඅවිය ඔබ භාරයට ගෙන කාර්යාලයීය වාර්තා අනුව මෙම අංක වෙනස්වීම ලිපිකරණ දෝෂයක් නිසා වූවක් ද නොඑසේනම් වංචනික ක්‍රියාවක ප්‍රතිඵලයක් ද යන්න පිළිබඳ වාර්තාවක් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා මා වෙත නොපමාව ඉදිරිපත් කරන්න.
iv. ගිනිඅවි පාවිච්චි කිරීමට අවශ්‍ය නිපුණත්වය ගිනිඅවි හිමිකරුට තවදුරටත් ඇති බවට බලපත්‍ර අධිකාරිය සෑහීමකට පත්විය යුතුය.
v. ඉඩම් සහ පදිංචි දිස්ත්‍රික්කය, දිස්ත්‍රික්ක දෙකක පිහිටා තිබේ නම් මුරකරු බලපත්‍රයක් ලබාගැනීම සිදුකළ යුතුය.

**4.4** තුවක්කු ආඥා පනතේ 22 (2) (උ) වගන්තියේ විධිවිධාන අනුව වාර්ෂික බලපත්‍රය අලුත් කිරීමෙන් තොරව ගිනිඅවියක් ළඟ තබාගත හැකි උපරිම කාලසීමාව දින 10ක් බැවින් නියමිත කාලසීමාව තුළ ඔබ වෙත අයදුම්පත්‍රය භාර දී ඇති නමුත් 2027.01.10 වන විට බලපත්‍රය ලබාගැනීමට නොහැකි වන සෑම ගිනිඅවියක්ම තාවකාලිකව ඔබ කාර්යාලය වෙත හෝ ආසන්නතම පොලිස් ස්ථානය වෙත භාරදිය යුතු බවට බලපත්‍රලාභීන් දැනුවත් කළ යුතු අතර, එසේ භාරදුන් බවට තහවුරු කරගැනීමෙන් පසු පමණක් බලපත්‍ර නිකුත් කළ යුතුය.

**4.5** ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම සඳහා මේ සමග එවන ඇමුණුම් A, B හා C හි දක්වා ඇති අයදුම්පත්‍ර භාවිත කළ යුතු අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ග්‍රාම නිලධාරී, ප්‍රාදේශීය ලේකම් හා කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ නිර්දේශ සහිතව ඔබ වෙත ලැබිය යුතු අතර, ගිනිඅවියේ සඳහන් කර ඇති අනුක්‍රමික අංකය හා අවසන් වරට ලබාගත් බලපත්‍රයේ සඳහන් අංකය සැසඳෙන බවට ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානාධිපති විසින් සහතික කර තිබිය යුතුය.

**4.6** ගිනිඅවියක් මුල් වරට ලබා ගන්නා අවස්ථාවේදී හෝ අවසන් වරට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බලපත්‍ර අලුත් කරන අවස්ථාවේදී සලකා බැලූ නිර්ණායක හා අවශ්‍යතාවය තවදුරටත් ගිනිඅවිහිමිකරුට පවත්නා බවට තහවුරු කරගැනීමෙන් අනතුරුව දිස්ත්‍රික් ලේකම් විසින් වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීමේ කටයුතු කල යුතුය. කෘෂිකාර්මික කටයුතු සඳහා නිකුත් කළ ගිනිඅවියක් නම් ප්‍රමාණවත් වගා ඉඩම් ද (තව දුරටත් වලංගු ඔප්පු, ඇටෝර්නි බලපත්‍ර/ සත්ත්ව පාලනය සඳහා ඊට අදාල නිර්ණායක) කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා නිකුත් කළ ගිනිඅවියක් නම් ඊට අදාල නිර්ණායක ද තිබිය යුතුය

**4.7** කෘෂිකාර්මික/ වගා ආරක්ෂක කටයුතු සඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම කළ යුත්තේ බලපත්‍රලාභියා පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින්ය. ඒ අනුව, 'A' අයදුම්පත්‍රය තමා පදිංචි වසමේ ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළ යුතුය. කෙසේ වුවද තමා පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත වගා කරනු ලබන ඉඩම් පිහිටා තිබේ නම්, එම ඉඩම පිහිටි වසමේ ග්‍රාම නිලධාරී/ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හෝ කෘෂිකර්ම උපදේශක විසින් ඉඩම පිළිබඳව හා වගා කරනු ලබන බවට හා වගා හානි සිදුවන බවට සහතිකයක් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

**4.8** ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමේ සියලුම වර්ගයේ අයදුම්පත්‍ර ආරක්ෂක අමාත්‍යාංශයේ www.defence.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

**4.9** රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා බැංකුවල ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමෙන් අනතුරුව මුරකරු බලපත්‍ර නිකුත් කිරීමේ දී අදාළ ආයතනයේ/ පුද්ගලයාගේ ඉල්ලීම් ලිපිය සමග මුරකරුවන් සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියාගේ නිර්දේශයත්, ග්‍රාම නිලධාරී විසින් ලබාදෙන පදිංචිය සනාථ කිරීමේ සහතිකයත් පොලිස් නිර්දේශයත් යන ලේඛන ලබාගත යුතුය. එසේම මුරකරු බලපත්‍ර වයස අවුරුදු 65 ඉක්මවූ පුද්ගලයන් වෙත නිකුත් නොකළ යුතුය.

**4.10** බලපත්‍ර අලුත් කිරීමේ උපරිම වයස් සීමාව 70 වේ.

5. <u>වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයන් සඳහා ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම</u>

**5.1** ගිනිඅවියක් භාවිත කිරීමට සුදුසු කායික හා මානසික තත්ත්වයකින් පසුවන බවට රජය පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් (ආකෘතිය H) මත වයස අවුරුදු 70-75 අතර පුද්ගලයින්ගේ කෘෂිකාර්මික සහ දේපළ කටයුතු සඳහා ලබාදී ඇති ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම සඳහා බලය ඔබ වෙත පවරන අතර, වයස අවුරුදු 75ට වැඩි, ගිනිඅවි හිමිකරු නමින්ම බලපත්‍ර ලබාගන්නා පුද්ගලයින් සඳහා සියලුම වර්ගයේ ගිනි අවි බලපත්‍ර අලුත් කිරීමේ දී, ඉල්ලුම්කරුට එම ගිනිඅවියේ අවශ්‍යතාව තවදුරටත් තිබේ ද යන්න පිළිබඳව

තහවුරු කර ගැනීමෙන් අනතුරුව වෛද්‍ය සහතිකයද (ආකෘතිය H) පදනම් කරගෙන ඔබගේ නිර්දේශය සහිතව මා වෙත ඉදිරිපත් කළ යුතුය.

**5.2** වයස අවුරුදු 75ට වැඩි මුරකරු බලපත්‍රයක් යටතේ බලපත්‍ර ලබාගැනීමට එකඟතාවය දක්වන පුද්ගලයින් සඳහා, කෘෂිකාර්මික හා දේපළ ආරක්ෂාව සඳහා භාවිත කරන ගිනිඅවි මුරකරු බලපත්‍රයක් යටතේ භාවිත කිරීමට යටත්ව බලපත්‍ර අලුත් කිරීම සඳහා බලය ඔබ වෙත පවරනු ලැබේ. එසේ මුරකරු බලපත්‍රයක් ලබාගන්නා අවස්ථාවේදී මුරකරුගේ වයස අවුරුදු 65 නොඉක්මවිය යුතුය. මෙහිදී ගිනිඅවි හිමිකරුට ගිනිඅවිය භාවිතා කළ නොහැක.

## 6. <u>ගිනිඅවි පැවරීම</u>

**6.1** ගිනිඅවිය පැවරීමේ දී ගිනිඅවි හිමිකරුගේ කලත්‍රයා, පුතා, දුව හෝ බෑණා, ලේලිය යන අයට මෙන්ම ගිනිඅවි හිමිකරුට දරුවන් නොමැති විට පැවරීමක් සිදු කිරීමට අපහසු බැවින් ගිනිඅවි හිමිකරුගේ සහෝදර සහෝදරියන් සිටිනම් ඔවුන්ට හෝ ඔවුන්ගේ දරුවන්ට තම අනන්‍යතාව සහ අවශ්‍යතාව තහවුරු කොට එම ගිනි අවි පවරා ගැනීමට අයදුම් කළ හැක. වයස අවුරුදු 70ට වැඩි ගිනි අවි හිමිකරුවන් වයස අවුරුදු 75 ඉක්මවීමට පෙර ගිනි අවි පැවරීමේ කටයුතු සිදු කළ යුතු අතර, නොඑසේ නම් මුරකරු බලපත්‍රයක් යටතේ පමණක් ගිනිඅවිය භාවිත කළ යුතුය.

**6.2** ගිනිඅවි පැවරීමට සුදුසුකම් සහිත පවුලේ සාමාජිකයෙකු නොමැති, එසේ වුවද ස්වකීය කෘෂිකාර්මික කටයුතු හෝ දේපළ ආරක්ෂාව සඳහා ගිනි අවියක අවශ්‍යතාව තවදුරටත් දැඩිව පවතින බවට දිස්ත්‍රික් ලේකම් පෞද්ගලිකව සෑහීමකට පත්වන්නේ නම් පමණක් ඉහත උපරිම වයස් සීමාව ඉක්මවූ බලපත්‍රලාභීන් සඳහා අනිවාර්යයෙන් මුරකරු බලපත්‍රයක් ලබාගැනීමේ කොන්දේසියට යටත්ව 2027 වසර වෙනුවෙන් බලපත්‍ර නිකුත් කළ යුතුය.

**6.3** ගිනිඅවි පැවරීමට ඉල්ලුම් කරන ගිනිඅවි හිමිකරුවන් විසින් තම ගිනි අවියට අදාළ බලපත්‍රය වලංගුව පවතින කාලය තුළ පැවරීමේ කටයුතු අවසන් කර ගැනීමට වග බලාගත යුතුය. පැවරීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවේදී වලංගු බලපත්‍රයක් නොමැති ගිනි අවි විධිමත් පරිදි පොලිස් ස්ථානයට භාරදී ඇති බවට අදාළ පොලිස් ස්ථානාධිපතිගෙන් සහතිකයක් නොමැති අවස්ථාවේදී ගිනිඅවි පැවරීම සඳහා වන ඉල්ලීම් නිර්දේශ නොකළ යුතු අතර, අදාළ ගිනි අවි විධිමත්ව පොලිස් භාරයට ගෙන වාර්තා කරන ලෙස අදාළ පොලිස් ස්ථානයන් වෙත දැන්විය යුතුය.

**6.4** පවරන්නාගේ අවම වයස් සීමාව වයස අවුරුදු 21 ඉක්මවිය යුතුය.

**6.5** ගිනිඅවි පැවරීමේ දී පමණක් සත්‍ය වශයෙන්ම වගා කරනු ලබන ඉඩම් ප්‍රමාණය අක්කර 02ක් ලෙස සැලකිය හැකිය.

**6.6** මුල් වරට ගිනිඅවිය මිලදී ගැනීමේ දී නිකුත් කරන අවසරපත්‍රය හා ගිනිඅවි බලපත්‍රයෙහි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.

## 7. <u>ගිනිඅවි බලපත්‍රය නැති වූ විට හෝ විනාශ වූ විට හෝ විරූපී වීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය</u>

**7.1** තුවක්කු ආඥා පනතේ 7 වන වගන්තිය ප්‍රකාර රු.10/=ක ගාස්තුවක් අය කිරීමෙන් අනතුරුව අදාළ තුවක්කු බලපත්‍රය නැතිවීම පිළිබඳ සහතිකයක් නිකුත් කළ හැකිය. එහෙත් ඊට පෙර එම බලපත්‍රය නැතිවීම හෝ විනාශ වීම පිළිබඳව කර ඇති දැන්වීම පිළිබඳව සෑහීමකට පත්විය යුතු අතර, ඒ සඳහා පොලිසියට කරන ලද පැමිණිල්ලක පිටපතක් ලබා ගත යුතුය.

නැතිවීම පිළිබඳව නිකුත් කරනු ලබන මෙම සහතිකයට වාර්ෂිකව පතරොම් නිකුත් කිරීම නොකළ යුතුය.

## 8. ගිනිඅවි හිමිකරු මියගිය අවස්ථාවක ගිනිඅවිය සන්තකයේ තබා ගැනීම

**8.1** ගිනිඅවි හිමිකරු මියගිය අවස්ථාවක එම ගිනිඅවිය පවුලේ සාමාජිකයෙකුට තම සන්තකයේ තබාගත හැක්කේ ගිනිඅවි හිමිකරු මිය ගිය දින සිට දින 30ක් ඉකුත් වන තෙක් පමණි. එම කාලසීමාව ඉකුත් වූ ගිනිඅවි වහාම පොලිස් භාරයට ගත යුතු බව ගිනිඅවිය සන්තකයේ දරන්නා දැනුවත් කළ යුතුය. ගිනිඅවියක් භාවිත කිරීමේ අවශ්‍යතාව පවුලේ සාමාජිකයෙකුට තවදුරටත් පවතින්නේ නම් අදාල ගිනිඅවි පැවරීම පිළිබඳ සුදුසු තීරණයක් ලබා දෙන තුරු ගිනිඅවිය ආසන්න පොලිස් ස්ථානයට තාවකාලිකව භාර ගන්නා ලෙස පොලිස් ස්ථානාධිපති දැනුවත් කළ යුතුය. තවදුරටත් ගිනිඅවියක අවශ්‍යතාවක් නොපවතින්නේ නම් ස්ථිරවම රජයට භාර ගත යුතු අතර එසේ භාරදීමෙන් පසු ගිනිඅවි ලේඛනයෙන් ඉවත්කර ඒ බව මෙම අමාත්‍යාංශයට දැනුම් දිය යුතුය.

## 9. ගිනිඅවි බලපත්‍ර ආදායම

**9.1** 2026 වර්ෂයට අදාළ වූ 10.03.07.05 දරන ආදායම් ශීර්ෂය 2027 වර්ෂයට ද වලංගු වේ. ඔබ විසින් බලපත්‍ර ගාස්තු අයකර ගනු ලබන සියලුම මුදල් මෙම ශීර්ෂයට බැර කළ යුතුය. හිඟ බලපත්‍ර ගාස්තු, දඩ මුදල් ආදායම්, ගිනිඅවි විකිණීමේ ආදායම වෙනම පෙන්විය යුතු වේ.

**9.2** 2027 වසරට ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම සඳහා අවශ්‍ය වන බලපත්‍ර ආකෘති පොත් ප්‍රමාණවත් අයුරින් ඔබ වෙත තබා ගත යුතුවේ.

**9.3** ගිනිඅවි බලපත්‍ර ආදායම් පිළිබඳ වාර්තාවක් සෑම මසකම මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) වෙත යොමු කිරීමට පියවර ගත යුතුය. එම වාර්තාවේ අදාළ වර්ෂයේ ගාස්තු, හිඟ මුදල් හා දඩ මුදල් වෙන් වෙන්ව සඳහන් කළ යුතුය.

**9.4** එම වාර්තාවේ පිටපතක් ගණකාධිකාරී (ආදායම්) ආරක්ෂක අමාත්‍යාංශය වෙත එවිය යුතුය. ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමේදී මාසික ඉලක්ක සැකසිය යුතුය. එම ඉලක්කවලට අනුව බලපත්‍ර අලුත් කරන්නේද නැද්ද යන්න වාර්තා කළ යුතු අතර, යම් මාසයක අපේක්ෂිත බලපත්‍ර ප්‍රමාණය අලුත් කිරීමක් නොකළේ නම් එම හිඟය ඊළඟ මාසයට එකතු විය යුතුය.

## 10. ගිනිඅවි බලපත්‍ර අධිකාරීත්වය වෙනස් කිරීම

**10.1** කිසියම් බලපත්‍රලාභියකු දිස්ත්‍රික්කයෙන් පිටතට තම පදිංචිය වෙනස් කර ගන්නේ නම් ඒ බව ඔහු විසින් නොපමාව ඔබ වෙත දැන්විය යුතුවේ. අනතුරුව තමන් අලුතෙන් පදිංචියට යන දිස්ත්‍රික්කයෙන් තවදුරටත් බලපත්‍ර ලබා ගැනීමට අදහස් කරන්නේ නම් ඒ බවට පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙහි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ විරුද්ධත්වයක් නොමැති බවට වූ ලිඛිත එකඟත්වය සහ ඊට අදාළ ලේඛන ලබාගෙන අධිකාරීත්වය මාරු කිරීමේ බලය සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදෙනු ලැබේ. පසුව ඒ පිළිබඳ මා දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය .

**10.2** දිස්ත්‍රික්කය තුළ පදිංචිය වෙනස් කරන්නේ නම්, ඒ සඳහා වූ අනුමැතිය ඔබ විසින් ලබාදිය යුතු අතර, එම වෙනස්වීම පිළිබඳ තොරතුරු මා වෙතද වාර්තා කළ යුතුය. තව ද, කෘෂිකර්ම අවශ්‍යතා සඳහා ලබාදුන් ගිනිඅවිවලට අදාළව ක්‍රියාත්මක වීමේදී තම දිස්ත්‍රික්කය තුළ බලපත්‍රලාභියා සතුව ප්‍රමාණවත් වගා ඉඩම් පවතින බවට සෑහීමකට පත්විය යුතුය.

## 11. අබලන් ගිනිඅවි වෙනුවට නව ගිනි අවි නිකුත් කිරීම

**11.1** තමන් සතු අබලන් ගිනිඅවිය වෙනුවට නව ගිනිඅවි නිකුත් කිරීමට ඉල්ලුම් කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳ සෑහීමකට පත් වූ පසුව ඔබගේ නිර්දේශය මත මා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

i. අදාළ ගිනිඅවිය අලුත්වැඩියා කිරීමකින් පසු නැවත භාවිතකළ නොහැකි තත්ත්වයට අබලන් වී ඇති බවටත් ගිනිඅවිය තමා භාරයට ගෙන ඇති බවට අදාළ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිගේ සහතිකය.

ii. ගිනිඅවිය මුල්වරට ලබා ගන්නා අවස්ථාවේදී පැවති අවශ්‍යතා තවදුරටත් ඉල්ලුම්කරු වෙත පවතින බව තහවුරු කර ගත යුතු අතර (වගා හානි සහතිකය, ගිනිඅවිය මිලදී ගැනීමේ අවසර පත්‍රයේ සහතික කල පිටපතක් හා ගිනිඅවිය සඳහා මුල්වරට ලබාගත් බලපත්‍රයේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය) , ඒ සඳහා ඔබගේ නිර්දේශය.

iii. දිස්ත්‍රික් සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක වෙතින් ලබාගත් පතරොම් පිළිබඳ වැය වාර්තාව.

**11.2** පොලිස් ස්ථානයට භාරදුන් අබලන් ගිනිඅවි කලින් කලට විනාශ කිරීම සඳහා පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයට භාරදිය යුතු බවට අදාළ පොලිස් ස්ථානාධිපතිවරු දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

## 12. ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමේ දී දැනට ලබාගත් අරමුණ වෙනස් කිරීම

**12.1** කෘෂිකාර්මික කටයුතු සඳහා ලබාදී ඇති ගිනිඅවියක අරමුණ වෙනස් කළ හැක්කේ දේපළ ආරක්ෂාව සඳහා පමණි.

**12.2** එසේ කිරීමේදී 2.3 හි සඳහන් නිර්ණායක සපුරා තිබීම අනිවාර්ය වන අතර, ඒ අනුව ඔබගේ නිර්දේශය සහිතව මාගේ අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

## 13. බලපත්‍ර ලබා නොගන්නා ගිනිඅවි හිමිකරුවන් පිළිබඳ ගනු ලබන ක්‍රියාමාර්ග

**13.1** නියමිත කාලසීමාව තුළ ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම පැහැරහරින ගිනිඅවි බලපත්‍රලාභීන් සම්බන්ධ තොරතුරු ගිනිඅවි ආඥා පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගැනීම අදාළ කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීන් වෙත යොමු කර මා වෙත වාර්තා කළ යුතුය.

**13.2** ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම ඉතා දැඩි පාලනයට යටත් කර ඇත්තේ, නුසුදුසු පුද්ගලයින් අත තුවක්කු ගැවසීම තුළින් වන සතුන්ට මෙන්ම සිවිල් ජන ජීවිතයටද බලවත් තර්ජන එල්ල විය හැකි බැවිනි. එබැවින්, ඔබ විසින් බලපත්‍ර අලුත් කරන ගිනිඅවි අගති සහගතව පරිහරණය කිරීම සඳහා යොදා නොගන්නා බවට සෑහීමකට පත්වීම අවසාන අපේක්ෂාවයි. එසේම, නිසි පරිදි බලපත්‍ර ලබා ගිනිඅවි පරිහරණය කරන පුද්ගලයින්ට ඉන් ඇතිවන අසීරුතා අවම කිරීමද මෙයින් බලාපොරොත්තු වේ. එබැවින්, මෙම කාර්යය පිළිබඳව ඔබගෙන් ලැබෙන සහාය ඉතා අගය කොට සලකන බවද කාරුණිකව සැලකුව මැනවි.

**13.3** මේ වන විට 2026 වර්ෂය දක්වා නිවැරදිව බලපත්‍ර අලුත් කර නොගත් ගිනිඅවි හිමිකරුවන්ට 2026.12.31 තෙක් ලබාදෙන කාලසීමාව තුල දඩ මුදල ගෙවා බලපත්‍ර අලුත් කර ගන්නා ලෙසත් ගිනිඅවිය තවදුරටත් අවශ්‍ය නොවේ නම් ස්ථිරව රජයට බාරදෙන ලෙසත් පෞද්ගලිකව දන්වන්න. 2026.12.31 වන විටද එලෙස බලපත්‍ර අලුත් කර නොගන්නා ගිනිඅවි හිමිකරුවන්ට නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවට ද අදාළ පුද්ගලයන් වෙත පෞද්ගලිකව දන්වන ලෙස දන්වමි.

13.4 2027.01.10 දින වන විට බලපත්‍ර අලුත් කර නොගන්නා පුද්ගලයින්ගේ නාම ලේඛනයක් නොපමාව ලිපිනයන් සමඟ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය පොලිස්පති වෙත ලබා දිය යුතුය.

14. <u>ගිනිඅවි බලපත්‍ර සඳහා වන වාර්තා ප්‍රමාද වීම</u>

14.1 පොලිස් ස්ථාන හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කාර්යාල මඟින් නිකුත් කරන වාර්තා ප්‍රමාද වීම හේතු කොටගෙන ගිනිඅවි බලපත්‍රලාභීන්ට බලපත්‍ර ගාස්තුවලට අමතරව දඩ ගාස්තුවලටද යටත්වීමට සිදුවන අවස්ථා දක්නට ඇත. මෙම ප්‍රමාදවීම් අවම කර ගැනීම සඳහා ඔබ ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමට කටයුතු කිරීම මැනවි.

14.2 ආරක්ෂක ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් වෙත 2026.12.31 දිනට ප්‍රථම අයදුම්පත්‍රය ඉදිරිපත් කර බලපත්‍රය අලුත් කර ගත යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුවට සමාන දඩමුදල් ගාස්තුවක් ගෙවිය යුතුය.

15. <u>පැරණි ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම</u>

15.1 1989 වර්ෂයෙන් පසුව දිවයිනේ ගිනිඅවි හිමිකරුවන් සතුව ඇති ගිනිඅවි සඳහා බලපත්‍ර නිකුත් කරන ලද්දේ 1997 වර්ෂයේ සිටය. 1996 වසරේදී තුවක්කු ආඥා පනත සංශෝධනය කිරීමෙන් පසුව, එතෙක් ගිනිඅවි සන්තකව සිටි සියලුම ගිනිඅවි හිමිකරුවන් 1997 වසරේ සිට නව බලපත්‍ර ලබාගත යුතු විය. ඒ අනුව, මෙම මුල් බලපත්‍රය, එනම් 1997 බලපත්‍රය නිකුත් කරන ලද්දේ මෙම අමාත්‍යාංශයෙනි.

15.2 එහෙත් 1997 වසර පසුවී තවත් වසර ගණනාවකට පසුවත් එවැනි ගිනිඅවි සඳහා බලපත්‍ර ලබා ගැනීමේ ඉල්ලීම් ඉදිරිපත්ව ඇති නිසා 2009 වර්ෂයේදී දෙමසක සහන කාලයක් ලබා දී පැරණි ගිනිඅවි බලපත්‍ර වෙනුවට නව බලපත්‍ර ලබා දී ඇත.

15.3 2016 වර්ෂයේදී අවස්ථා දෙකකදී, 2020 වර්ෂයේ දී හා 2023 වර්ෂයේදී අනවසර ගිනි අවි රජයට භාරදීම සඳහා පොදු සමාකාලයක් ලබා දුන් බැවින්, එම අවස්ථාවන් ප්‍රයෝජනයට ගනිමින් බලපත්‍ර රහිත ගිනිඅවි රජයට භාර නොදුන් ගිනිඅවි හිමිකරුවන්ගේ බලපත්‍ර 2027 වර්ෂය සඳහා අලුත් නොකළ යුතු අතර, අදාළ ගිනිඅවි හිමිකරුවන්ට එරෙහිව නීතිමය වශයෙන් කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත වාර්තා කළ යුතුය.

16. <u>වලංගු බලපත්‍රයක් නොමැතිව ගිනිඅවියක් ළඟ තබා ගැනීමට දඬුවම්</u>

**16.1** තුවක්කු ආඥා පනතේ 22 (2) (ඇ) අනුව යම් තැනැත්තෙකු සතුව ඇති ගිනිඅවියකට නිකුත් කර ඇති බලපත්‍රයේ වලංගු භාවය අහෝසි වී දින දහයක (10) කාල සීමාවක් තුළ පමණක් එම ගිනිඅවිය තම සන්තකයේ තබා ගත හැකිය.

**16.2** ඉන් පසුව, එම අවිය ඔහු සන්තකයේ තබා ගත නොහැකි අතර, තවදුරටත් තබා ගන්නේ නම් එය තුවක්කු ආඥා පනත යටතේ වූ වරදක් වන අතර, ඊට ලැබෙන දඬුවම් පහත සඳහන් කරමි.

i. ඒ වරද පළමුවන වතාවට කළ විට රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇති බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය.

ii. ඒ වරද දෙවන වරට හෝ ඉන් පසුව කළ විට, අවුරුදු දහයකට නොඅඩු හා අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේය.

iii. එසේ වුවද, එම වරද ස්වයංක්‍රීය තුවක්කුවක් හෝ රිපීටර් ෂොට් ගන් තුවක්කුවක් භාරයේ හෝ සන්තකයේ තබා ගැනීමෙන් හෝ පාවිච්චි කිරීමෙන් සමන්විත වන අවස්ථාවක, වරදකරු ජීවිතාන්තය දක්වා බන්ධනාගාර ගත කරනු ලැබීමෙන් දඬුවම් කළ යුතුය.

**16.3** ගිනිඅවි හිමිකරුවන් සිය ගිනිඅවි පාවිච්චි කිරීමේදී පහත සඳහන් කොන්දේසිවලට යටත් වන බව දැනුවත් කළ යුතුවේ.

i. වගා ආරක්ෂාව/සත්ත්ව පාලනය සඳහා පමණක් භාවිත කිරීමට ලබාදී ඇති ගිනිඅවියක් නම් එය වගා ඉඩම් පිහිටි දිස්ත්‍රික්කයෙන් පිටතට ගෙන යාම සහ වන සතුන් දඩයම් කිරීම තහනම් වේ. තව ද, බලපත්‍රකරු වගා ඉඩම් පිහිටි දිස්ත්‍රික්කයේ පදිංචි නොමැති අවස්ථාවල මුරකරු බලපත්‍රය ලබාගැනීම අනිවාර්ය වේ.

ii. බලපත්‍රලාභියාට හැර ගිනිඅවිය වෙනත් කිසිම අයෙකුට පාවිච්චි කිරීමට හෝ සන්තකමයේ තබා ගැනීමට ඉඩ නොදිය යුතුය (මුරකරු බලපත්‍රයක් ලබා දී ඇති අයෙකුට එය අදාළ නොවේ).

iii. වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ ආඥා පනතට යටත්ව ගිනිඅවි පරිහරණය කළ යුතු අතර, වන සතුන් දඩයම් කිරීම හා මරා දැමීම තහනම් වේ.

iv. ළමුන්ට ළඟාවිය නොහැකි පරිදි ආරක්ෂාකාරී ස්ථානයක සුරක්ෂිතව ගිනිඅවිය සන්තකයේ තබා ගැනීමට වග බලා ගත යුතුය.

v. වාර්ෂිකව ගිනිඅවි බලපත්‍ර දිසාපති කාර්යාල මගින් අලුත් කර ගත යුතු අතර, එසේ නොමැතිව සන්තකයේ තබා ගැනීම නීති විරෝධී වේ.

vi. පවතින රජයට එරෙහිව හෝ කිසියම් රාජ්‍ය විරෝධී ක්‍රියාවන් සඳහා හෝ වෙනත් නීති විරෝධී ක්‍රියාවක් සඳහා ගිනිඅවි පාවිච්චි නොකළ යුතුය.

vii. ගිනිඅවිය පොදු ප්‍රවාහන සේවයක රැගෙන නොයා යුතු අතර, ගිනිඅවිය ප්‍රවාහනය කරන අවස්ථාවල උණ්ඩ ඉවත්කර බඳ කොටස වෙන්කර රැගෙන යා යුතුය.

viii. ගිනිඅවිය අලුත්වැඩියා සිදුකල යුතු අවස්ථාවන්හිදී දිස්ත්‍රික් ලේකම්ගේ අවසර ලබාගෙන මෙම චක්‍රලේඛයෙහි 16.3(vii) ඡේදය අනුව කටයුතු කල යුතුය.

ix. වගා ඉඩම සත්ත්ව ගොවිපල හෝ දේපළ තමා පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පිටත පිහිටා ඇත්නම්, ඉඩම් පිහිටි වසමේ ග්‍රාම නිලධාරී සහතිකය සමග අදාළ අයදුම්පත්‍රය තම ප්‍රාදේශීය ලේකම් මගින් ඉදිරිපත් කළ යුතුය.

**16.4** ඉහත කොන්දේසිවලට පටහැනිව කටයුතු කරනු ලබන ගිනිඅවි හිමිකරුවන්ගේ ගිනිඅවි සඳහා නිකුත් කර ඇති බලපත්‍ර ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතු වන අතර, ඉන්පසු ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ඒ බව මෙම අමාත්‍යාංශය වෙත වාර්තා කළ යුතුය.

**16.5** කෘෂිකාර්මික කටයුතු/ සත්ත්ව පාලනය සඳහා නිකුත් කරනු ලබන්නේ තනි කාණුවේ බෝර 12 පතරොම් තුවක්කුවක් පමණි.

17. මුරකරු බලපත්‍රයක් යටතේ ගිනිඅවි ඉල්ලුම් කිරීමේ දී මුරකරු සම්බන්ධයෙන් ඉදිරිපත් කල යුතු ලේඛණ.

i. මුරකරු බලපත්‍රයක් යටතේ ගිනිඅවිය භාවිතා කිරීමට ගිනිඅවි හිමිකරුගේ කැමැත්ත සඳහන් ලිපිය.
ii. මුරකරු වශයෙන් නම් කරන ලද පුද්ගලයා ගිනිඅවිය භාවිතා කිරීමට කැමැත්ත දක්වන ලිපිය.
iii. මුරකරු නමින් ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකය
iv. මුරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
v. පොලිස් නිශ්කාෂණ වාර්තාව.
vi. ගිනිඅවියක් භාවිත කිරීමට අවශ්‍ය ප්‍රවීණතාව ඇති බවටත්, ගිනිඅවිය අවභාවිත නොකරන බවට හා බලපත්‍ර කොන්දේසි කඩ නොකරන බව සඳහන් දිවුරුම් ප්‍රකාශයක්.

18. ගිනිඅවි බලපත්‍ර නිකුත් කිරීම සලකා බැලීම සඳහා ගිනිඅවියක් ඉල්ලුම් කිරීම සඳහා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේදීම පෞද්ගලික තොරතුරු පෝරමය ඉදිරිපත් කල යුතුය. (අදාල පෝරමය defence.lk යන වෙබ් අඩවිය හරහා ලබාගත හැක.)

19. ගිනිඅවි විකිණීමේදී ගිනිඅවි ආඥාපනතේ 12(1),12(2),12(3) හා 12(4) වගන්ති ප්‍රකාරව බලපත්‍ර ගාස්තු ගෙවා ගිනිඅවි විකිණීමේ බලපත්‍රය වාර්ෂිකව මෙම අමාත්‍යාංශය වෙතින් ලබාගත යුතුය.

20. විදේශ ගතවන අවස්ථාවලදී ගිනිඅවිය ළඟම තිබෙන පොලිස් ස්ථානයට භාරදිය යුතු අතර, මුරකරු බලපත්‍ර යටතේ ගිනිඅවි බලපත්‍ර භාවිත කරන හිමිකරුවන් විදේශගත වන අවස්ථාවලදී, ඒ පිළිබඳ ළඟම තිබෙන පොලිස් ස්ථානයට දැනුම් දීම කළ යුතුයි. කෙසේ වුවද ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීමට ගිනිඅවි හිමිකරු පැමිණිය යුතුය.

21. ප්‍රාදේශීය/ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු නිර්දේශ ලබා ගැනීම අත්‍යවශ්‍ය නොවන අතර අවශ්‍ය වන්නේ නම් අදාළ කමිටු මගින් නිර්දේශ ලබා ගැනීමට මෙමගින් බාධාවක් නැත.

22. නව ගිනිඅවියක් මිලදී ගැනීම සඳහා වන අවසරපත්‍රයේ වලංගු කාලය දින 30ක් පමණ වන අතර, දින 30 ඉක්මවූ පසු දින දීර්ඝ කිරීමේ බලය සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත හා වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි හා පතරොම් මිලදී ගැනීමේ ඒකකයේ අධ්‍යක්ෂ වෙත ද ලබාදෙන අතර, එක් වරකදී අවසරපත්‍රයේ වලංගු කාලය උපරිම දින 30ක් සඳහා පමණක් වන අතර උපරිම අවස්ථා 03ක් ඇතුලත දීර්ඝ කිරීමට කටයුතු කළ යුතුය.

23. වාර්ෂික ගිනිඅවි බලපත්‍රයේ හා මුරකරු බලපත්‍රයේ (අදාළ වගා ඉඩම්/ ආරක්ෂා කළ යුතු දේපළ) පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා ග්‍රාම නිලධාරී වසම සඳහන් කළ යුතුය.

24. ගිනිඅවි බලපත්‍ර අලුත් කිරීම ගිනිඅවි හිමිකරු පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් මගින් සිදුකළ යුතුය. නව ගිනිඅවි ඉල්ලුම් කිරීමේ දී අදාළ ඉල්ලුම් පත්‍රයේ සියළුම කොටස් අයදුම්කරු පදිංචි ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී, කොට්ඨාසයේ පොලිස් අධිකාරී,

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්, පදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් නිර්දේශ සමග ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය.

**25.** කෙසේ වුවද, ඉඩම / ව්‍යාපාර / දේපළ පිහිටා ඇත්තේ ගිනිඅවි හිමිකරු පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත නම්, සත්‍ය වශයෙන්ම වගා කරනවා ද, වගාවට වන සත්ත්ව හානි පවතිනවාද එම ව්‍යාපාර / දේපළ තිබෙනවා ද යන්න පිළිබඳ ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී/ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර/ කෘෂිකර්ම උපදේශක මඟින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව බලපත්‍ර අලුත් කිරීම සිදු කළ යුතුය.

**26.** මෙම චක්‍රලේඛයේ සඳහන් සියලුම විධිවිධාන සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ බලය ආරක්ෂක ලේකම් ලෙස මා සතුය.

**27.** මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අදහස් හා යෝජනා සළකා බැලීමෙන් පසුවය.

**එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික)**
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී //, ආර්එස්පී /, යූඑස්පී, එල්එන්ඩීයු (චීනය),පීඑස්සී
**ලේකම්,**
**ආරක්ෂක අමාත්‍යාංශය.**

**පිටපත්:**

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. - කරු. දැනගැනීම සඳහා

2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කරු. කෘෂිකර්ම උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා.

3. පොලිස්පති, පොලිස් මූලස්ථානය. - චක්‍රලේඛයේ 13.4, 14.1 හා 15.3 වගන්ති ප්‍රකාරව සියලුම නියෝජ්‍ය පොලිස්පතිවරුන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීම සඳහා හා ආඥාපනත ක්‍රියාත්මක කිරීමට අදාලව ඔබ වෙත පැවරෙන කාර්යයන් (ගිනිඅවි අත් අඩංගුවට ගැනීම, ගිනිඅවි සම්බන්ධ නඩු පැවරීම, ගිනිඅවි භාරගැනීම) සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයන් පිළිබඳව අදාළ පරිපාලන දිස්ත්‍රික් බලධාරියා ලෙස දිස්ත්‍රික් ලේකම් දැනුවත් කිරීම සඳහා.

4. ජාතික බුද්ධි ප්‍රධානි, ආරක්ෂක අමාත්‍යාංශය - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා.

| | | |
|---|---|---|
| 5. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | - | කරු. දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් දැනුවත් කිරීම සඳහා. |
| 6. අධ්‍යක්ෂ ජනරාල්,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව. | - | කරු. කෘෂිකර්ම උපදේශකවරුන් දැනුවත් කිරීම සඳහා. |
| 7. අධ්‍යක්ෂ ජනරාල්,<br>සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | - | කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා. |
| 8. අධ්‍යක්ෂ,<br>වාණිජ පුපුරණ ද්‍රව්‍ය, ගිනිඅවි හා පතරොම්<br>මිලදී ගැනීමේ ඒකකය | - | කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා. |
| 9. සියලුම සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලකවරුන් | - | කරු. දැනගැනීම සඳහා |